# ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු රටේ නීතියට අනුකූලව කරන්න

## මැතිවරණ නිරීක්ෂකයෝ අපේක්ෂකයන්ගෙන් ඒකාබද්ධ ඉල්ලීමක් කරති

ගයාත්‍රි සිංහආරච්චි

**ජනාධිපතිවරණය** සඳහා ඇති ඉදිරි දින 28 ක කාලය තුළ රටේ පවතින මැතිවරණ නීති රීතිවලට අනුකූලව තම ප්‍රචාරක කටයුතු මෙහෙයවන ලෙස සියලුම දේශපාලන පක්ෂ වලින් සියලු මැතිවරණ නිරීක්ෂකයන් ඒකාබද්ධව ඉල්ලා සිටින්නේ යැයි පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඊයේ (11) පැවසීය.

ජනාධිපතිවරණයට අදාළව නිරීක්ෂණ සංවිධාන ඒකාබද්ධව, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ඊයේ (11) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී හෙට්ටිආරච්චි මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රෝහණ හෙට්ටිආරච්චි මහතා:

"දේශපාලන ක්ෂේත්‍රය තුළ මේ දිනවල සිද්ධ වන ලැජ්ජා සහගත විල්බාරුව ජනතාවගේ බුද්ධියට නිගා කිරීමක්. ඒනිසා සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් දේශපාලනයට ගෙන් ඒමට ජනතාව බුද්ධිමත් විය යුතුයි. තම ප්‍රතිපත්ති, රටේ වගකීම පසෙකලා පෞද්ගලික ප්‍රභූ විහරණය පමණක් සිතන පුද්ගලයන් තවදුරටත් බලයට ගෙන එනවාද කියලා ජනතාව දැන් කල්පනා කළ යුතුයි.

ඒ වගේම මැතිවරණය තුළ රාජ්‍ය බලය, රාජ්‍ය දේපළ භාවිතය ඉතාම ඉහළ ගිහින් තියෙන බව දැකිය හැකියි. ඒ නිසාම රාජ්‍ය දේපළ හා රාජ්‍ය බලය අයථා ලෙස පරිහරණය කිරීමෙන් තොරව මැතිවරණය පවත්වාගෙන යාමට මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දීම සියලු දෙනාගේම වගකීමක් වෙනවා. ඒ වගේම අපක්ෂපාතීව තම රාජකාරිය ඉටු කිරීමට රජයේ සේවකයන් සියලු දෙනාද මෙහිදී වගබලා ගත යුතුයි.

එමෙන්ම මැතිවරණය ප්‍රකාශයට පත්වී දින කිහිපයක් ගතවෙත්ම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කීපයෙක් ඉහළ ගිහින්. පසුගිය සති දෙකක කාලය තුළ ගැටුම්කාරී සිද්ධීන් විශාල ගණනක් පිළිබඳව තොරතුරු වාර්තා වුණා. ඒ නිසාමේ තත්ත්වය වළක්වාලීම සඳහා පොලිසිය අපක්ෂපාතීව වගේම කඩිනමින් ක්‍රියා කළ යුතු බවත් අවධාරණය කරනවා. මෙම ප්‍රචණ්ඩ ක්‍රියා අවම කිරීමට මැදිහත් වන ලෙස අපි සියලු දෙනා සියලුම ආගමික නායකයන්ගෙන් ද ඉල්ලා සිටිනවා."

මෙහිදී අදහස් දැක්වූ කැෆේ සංවිධානයේ විධායක අධ්‍යක්ෂ කීර්ති තෙන්නකෝන් මහතා:

"18 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක මැතිවරණයේ සුජාත බව දිනෙන් දින වළ පල්ලට යන බව ඉතාම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. පසුගිය පළාත් සභා මැතිවරණ ගණනාවකදීම මහජන දේපළ අයථා පරිහරණය, රාජ්‍ය බලය අවභාවිතය, පොලිසියේ පක්ෂග්‍රාහී ක්‍රියා පිළිවෙත හොඳින්ම



මැතිවරණ නිරීක්ෂකයන් මාධ්‍ය අමතමින්

ඡායාරූපය- ප්‍රනීත් ද සොයිසා

දැකගත හැකිවුණා.

අද වෙද්දී 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් බිහිවුණු දරුවො සියලු දෙනාම එකතු වෙලා ඉතාම සූක්ෂම ආකාරයට සර්ව ජන ඡන්ද බලය දූෂණය කරමින් ඉන්නවා. මේ තත්ත්වය ඉතා ඉක්මනින් වෙනස් කළ යුතුයි. එය නැතිව කළ නොහැකි දෙයක්. ඒ සඳහා සියලු දෙනා එක්විය යුතුයි.

මෙහිදී අදහස් දැක්වූ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ එස්. රනුගේ මහතා:

"මේ වෙද්දී හොඳ දේපළ අවභාවිතය ඉතාම වැඩිවෙලා. මේ තරම් ලැජ්ජාහීනී ආකාරයට රජයේ සේවකයන්, රජයේ දේපළ මැතිවරණයට නීතිවිරෝධීව යොදාගත් වෙනත් මැතිවරණ අවස්ථාවක් නැති තරම්. ඒ තරමටම රජයේ සේවකයන්, දේපළ මැතිවරණ කටයුතු සඳහා අයථා ලෙස භාවිතයට ගනු ලබනවා.

මැතිවරණ වංචා කළ බවට මෙතෙක් රජයේ සේවකයන්ට චෝදනා තිබුණේ නැහැ. නමුත් දැන් පවතින තත්ත්වය අනුව මැතිවරණයේ විනිවිදභාවය පිළිබඳවත් ගැටලු මතුවෙනවා. ඒ නිසා ජනතා විශ්වාසය රැකගත හැකි, අවංකව හා පක්ෂපාතීව මැතිවරණ රාජකාරී ඉටු කිරීමට රාජ්‍ය සේවකයා වගබලාගත යුතු වෙනවා. ඒ සඳහා ඔවුන් බිය යුතු නැහැ. තම හිතට එකඟව, අවංකව කටයුතු කිරීමට ඔවුන් කැපවිය යුතුයි. තම නායකයා නිදහසේ තෝරා ගැනීමට මහජනතාවට ඇති අයිතිය තහවුරු කළ යුතුයි."

මෙහිදී අදහස් දැක්වූ මැතිවරණ ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක ඩී. එම්. දිසානායක මහතා:

"මේ මැතිවරණය ජාතික වශයෙන් ඉතාම වැදගත් වගේම තීරණාත්මක මැතිවරණයක්. විධායක ජනපති ක්‍රමයේ හොඳ සහ නරක දැකපු ජනතාවට එම ක්‍රම තවදුරටත් පවත්වා ගන්නවාද, නැත්නම් ඉන් බැහැර වනවාද යන්න නිවැරදිව තීරණය කිරීමට ඉතාම හොඳ අවස්ථාවක් ලැබිලා තියෙනවා. ඒ තීරණය නිදහසේ ගැනීමට ජනතාවට ඉඩ දීම සියලු දෙනාගේ වගකීමක්. ජනතාවගේ නිවැරදි මතය නිවැරදිව සිය ඡන්දය මත සලකුණු කිරීමට ඉඩ සැලසිය යුතුයි.

ප්‍රචණ්ඩ ක්‍රියා ඉහළ යන බව අපට දිනෙන් දින පේනවා. ඒ නිසා මෙලෙස ප්‍රචණ්ඩකාරීව හැසිරෙන දේශපාලනඥයන් දේශපාලනයෙන් ඉවත් කිරීමට ජනතාවට විශාල වගකීමක් තියෙනවා.

ඒ නිසා නිවැරදිව තම ඡන්දය භාවිත කරලා තම වගකීම නිසි ලෙස ඉටු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම හැම දෙනාම ඡන්දය භාවිත කිරීමත් හරිම වැදගත්.

ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක නිශාන්ත රසංග හරිස්චන්ද්‍ර, නිදහස් හා සාධාරණ මැතිවරණ ව්‍යාපාරයේ විධායක කමිටු සාමාජික හර්ෂ ගුණසේන යන මහත්වරු සහ ලංකාවේ මව්වරු හා දියණියෝ සංවිධානයේ ජාතික සම්බන්ධීකාරක දයා හේරත් මහත්මියද මෙහිදී අදහස් දැක්වූහ.